# ශ්‍රී ලංකාවේ ආගන්තුක සත්කාර සේවා පිළිබඳ විදේශීය සංචාරකයන්ගේ තෘප්තිමත්භාවය සඳහා බලපාන සාධක අධ්‍යයනය (ඇල්ල.සංචාරක ප්‍රදේශය ආශ්‍රයෙන්)

*එම්.ආර්.එම්. උෂාන්* [1], *එච්.ජී.කේ.එන්. තරුෂි* [2]

සංචාරක ව්‍යාපාරය ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ තීරණාත්මක අංගයක් වේ. මේ වන විට ශ්‍රී ලංකාවට සංචාරක පැමිණීමේ ප්‍රවණතාවක් පවතියි. ශ්‍රී ලංකාවේ ආගන්තුක සත්කාර පිළිබඳ විදේශීය සචාරකයන්ගේ තෘප්තිමත්භාවය සහ ඊට බලපාන බොහෝ වැදගත් සධක සොයා ගැනීම සඳහා මෙම අධ්‍යයනය සිදු කරන ලදී. ආගන්තුක සත්කාර සේවා සම්බන්ධයෙන් විදේශීය සංචාරකයන්ගේ තෘප්තිමත්භාවය කෙසේද යන්න අධ්‍යයනයේ ප්‍රධාන ගැටලුව වන අතර ආගන්තුක සත්කාර සේවා සම්බන්ධයෙන් විදේශීය සංචාරකයන්ගේ සමස්ත තෘප්තිය තක්සේරු කිරීම මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ විය.මෙම අධ්‍යයනය ප්‍රාථමික දත්ත මත පදනම් විය.ශ්‍රී ලංකාවේ ඇල්ල සංචාරක ප්‍රදේශයට පැමිණෙන විදෙස් සංචාරකයන් ගෙන් දත්ත රැස්කිරීම සිදු විය. ඒ යටතේ පහසු නියැදීමේ ක්‍රමය යොදා ගනිමින් තෝරාගත් නියැදිය තුළින් ප්‍රතිචාරකයන් 50 දෙනෙකුගෙන් දත්ත රැස් කරනු ලැබීය. අර්ධ ව්‍යුහගත ප්‍රශ්නාවලියක් යොදා ගනිමින් දත්ත රැස් කරන ලදී.සම්මුඛ සාකාච්ඡා සහ මාර්ගගත ක්‍රමය ඔස්සේ මෙය සිදු විය. පර්යේෂණය ගුණාත්මක ප්‍රවේශය ඔස්සේ සිදු වූ අතර පර්යේෂණ සැලසුමද එයට සුදුසු පරිදි සිදු විය. රැස් කරනු ලැබූ දත්ත තේමා විශ්ලේෂණය යටතෙ බණ්ඩණය කොට විස්තරාත්මක දත්ත විශ්ලේෂණය යටතේ විශ්ලේෂණය සිදුවිය. විස්තරාත්මක සංඛ්‍යාන ක්‍රමවේදය මගින් දත්තවල ප්‍රථිපල සංසන්දනය කිරීමක් විශ්ලේෂණය තුලදි සිදුවිය. ලාංකේය ආගන්තුක සත්කාර සේවා පිළිබඳ විදේශීය සංචාරකයන්ගේ තෘප්තිමත්භාවය අධ්‍යයන කිරිම සඳහා තෘප්තිමත්භාවය ට බලපාන සාධක ලෙස නවාතැන්, ආරක්ෂාව,සෞඛ්‍ය ආරක්ෂාව,මිල සහ ගෙවීම්, ප්‍රවාහනය, කාර්යාල, මෙහෙයුම් සහ ආහාරපාන යන සාධක මෙහිදි යොදා ගන්නා ලදි. විදේශීය සංචාරකයන්ගේ තෘප්තිමත්භාවය සඳහා බලපාන සාධක අතුරින් නවාතැන්, ආහාරපාන, ප්‍රවාහනය සම්බන්ධයෙන් ඉහළ තෘප්තිමත්භාවයක් ද මිල සහ ගෙවීම්, ආරක්ෂාව සහ සෞඛ්‍ය ආරක්ෂාව, කාර්යාල, මෙහෙයුම් සම්බන්ධයෙන් මධ්‍යස්ථ තෘප්තියක් ද සොයාගැනීම් තුළින් පෙන්නුම් කරයි.සංචාරකයන්ගේ සමස්ථ අත්දැකීම් ගොඩනැගීමේදී ඔවුන්ගේ තෘප්තියට සහ නැවත පැමිණීමේ සම්භාවිතාවට බලපෑම් කිරීම සඳහා ආගන්තුක සත්කාර සේවා ප්‍රධාන කාර්යයභාර්යයක් ඉටු කරයි. උසස් තත්ත්වයේ ආගන්තුක සත්කාර සේවා මගින් ගමනාන්තයක ආකර්ෂණය වැඩි දියුණු කළ හැකි අතර එය ධනාත්මක මුඛයෙන් ප්‍රවර්ධනය කිරීමට සහ සංචාරක පැමිණීම වැඩි කිරීමට හේතු වේ. සංචාරකයන්ගේ තෘප්තිමත්භාවය වැඩිදියුණු කලයුතු අංග පිළිබඳ සියුම් අවබෝධයක් ලබාගනු වස් මෙම අධ්‍යයනය වැදගත් බවද සඳහන් කල යුතුය.

***ප්‍රමුඛ පදඃ*** ආගන්තුක සත්කාර, සංචාරක තෘප්තිමත්භාවය, ඇල්ල ප්‍රදේශය, ශ්‍රී ලංකාව

[1] ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය. ushanu450@gmail.com

[2] ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය. nethmatharushi1@gmail.com